# කර්මය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම සමාජගත වීමේ ස්වරූපය

එම්. ඒ. අයි. යු. විජේතිලක[1]

## හැඳින්වීම

නො වියත් සැදැහැතියන්ගෙන් සහ වියත් මිසදිටුවන්ගෙන් ද ගහන වූ නූතන බෞද්ධ සමාජයෙහි වෙනත් වාද ගැන මෙන් ම කර්මවාදය ගැන ද විවිධ සඞ්කීර්ණ අදහස් ව්‍යාප්ත වී ඇත. වෛදික යුගයේ සිට නූතන යුගය දක්වා භාරතීය දර්ශනවාද සහ ආගම ධර්ම කෙරෙහි ද පෙර'පර දෙදිග වෙනත් චින්තන සම්ප්‍රදායයන් කෙරෙහි ද අධිපති වශයෙන් කර්ම ආභාසය ලැබී ඇත. තිදොරින් පළවන ක්‍රියා සහ එහි ඵල ද 'කර්ම' ශබ්දයෙන් ගම්‍ය වේ. භෞතික ලෝකයෙහි ක්‍රියාත්මක වන හේතු-ඵලවාදයට අනුරූප ව සජීවී ලෝකයෙහි සත්ත්වයන්ගේ විශේෂයෙන් ම මිනිසුන්ගේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ආචාරවිද්‍යාත්මක ව අර්ථවත් වන හේතු-ඵලවාදය කර්මය යනුවෙන් ප්‍රකට වේ. යට සාකච්ඡා කළ පරිදි 'කර්මය' යන්නෙහි වචනාර්ථය 'ක්‍රියාව' යන්න යි. එහෙත් බුද්ධදේශනාවෙහි කර්මය යනු ක්‍රියාව පමණක් නො ව ක්‍රියාව සඳහා ඇතිවන්නා වූ චේතනාව ද මූලික වන බව දක්වේ. චේතනාව යනු සිතේ පවත්නා බලවත් චෛතසිකධර්මයකි. එම බලවත්කම නිසාවෙන් ම චේතනාව මූලික ව කර්මය සිදු වේ. එම චේතනාව මූලික කරගනිමින් ම කරන ලද කර්මයෝ හොඳ හෝ නරක වශයෙන් නැති නම් කුසල හෝ අකුසල වශයෙන් වර්ග වේ. හොඳ දෙයක් කරන විට කුසල චේතනාවක් ද නරක දෙයක් කරන විට අකුසල චේතනාවක් ද පහළ වේ. මෙනිසා ම කුසල සිතින් කුසල කර්මත් අකුසල සිතින් අකුසල කර්මත් සිදු වේ. චේතනාව කර්මය බැවින් කර්මය සචේතනික වේ. කර්මය හැඳින්වීම සඳහා 'ධම්ම' යන්න ද භාවිත වේ. ධම්ම මනසින් හටගෙන මනස පෙරටු කොට ගෙන මනස නායක කොට ගෙන පවතී.

## පර්යේෂණ අරමුණ සහ පර්යේෂණ ගැටලුව

කර්ම සඞ්කල්පය පිළිබඳ බොහෝ දෙනෙකුට ඇත්තේ වැරදි වැටහීමකි. ඒ නිසා ම සියල්ල කර්මය මත විනිශ්චය කිරීමට මහජනයා නිරායාසයෙන් ම පෙළඹී ඇත. මෙම තත්ත්වය ඍජුව ම සමාජ ප්‍රගතිය ඍණාත්මක දිශාවකට ගෙනයාමට හේතු යුක්ත වන නිසාවෙන් කර්මය පිළිබඳ නියම බෞද්ධ ආකල්පය සමාජගත කිරීම කාලීන ව වැදගත් වේ. බෞද්ධ කර්ම සඞ්කල්පය විවිධ නයින් සමාජගත වන අතර, ඒ අතරින් ධර්මදේශනා, රූපවාහිනී සහ ගුවන්විදුලි වැඩසටහන්, දහම්පාසල් අධ්‍යාපනය, පාසල් අධ්‍යාපනය, පුවත්පත් සහ සඟරා වැනි මාධ්‍යයන් ප්‍රමුඛ වේ. එම මාධ්‍ය මඟින් සමාජගත වන කර්ම සඞ්කල්පය මෙම පර්යේෂණයේ දී විමසුමට ලක්වන බැවින් ඒ පිළිබඳ නිරවුල් අවබෝධය ඇති කර ගැනීම වැදගත් වේ. කර්මය පිළිබඳ සඞ්කල්පය සමාජ ප්‍රගතියට බලපා ඇති ආකාරය හඳුනා ගැනීමට මෙන් ම එය බෞද්ධ කර්ම සඞ්කල්ප නිසාවෙන් සිදු වූවක් නො ව වෙනත් මිථ්‍යා සඞ්කල්පයක් දැඩි ව අල්ලා ගැනීමේ ප්‍රතිඵලයක් ද යන්න වටහා ගැනීමට වැදගත් වේ. කර්මය පිළිබඳ බෞද්ධ ආකල්පය

---

[1]. බෞද්ධ දර්ශනය, ශාස්ත්‍රවේදී ගෞරව (උපාධි අපේක්ෂක), පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
*inderjith1995@gmail.com*

හඳුනා ගැනීමට ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ත්‍රිපිටකය ගුරුකොට ගන්නා බැවින් ද කර්මය පිළිබඳ රචනා වී ඇති ද්විතීයික මූලාශ්‍රය ද භාවිත වන නිසාවෙන් පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් මූලික වන්නේ මූලාශ්‍රය අධ්‍යයනය යි. තව ද කර්මය පිළිබඳ මහ සමාජයේ මතය විමර්ශනය සඳහා සමීක්ෂණ පත්‍රිකා භාවිත කිරීමට අපේක්ෂා කෙරේ. කර්මය පිළිබඳ සංකල්පය ගැඹුරු කියවීමකින් යුතු විෂය විශාරදයන් සමඟ සම්මුඛ සාකච්ඡා වශයෙන් ද කරුණු විමර්ශනය කිරීමට අපේක්ෂා කරයි. සමස්තයක් වශයෙන් සාහිත්‍යමය පර්යේෂණ ක්‍රමය ද සමාජවිද්‍යාත්මක පර්යේෂණ ක්‍රමය ද මෙම පර්යේෂණයේ දී ප්‍රමුඛ කර ගැනෙන අතර, දත්ත රැස් කිරීම, එම දත්ත විශ්ලේෂණය කිරීම, එම විශ්ලේෂිත දත්ත සාධනීය ලෙස පර්යේෂණ කාර්යයට භාවිත කිරීමට අපේක්ෂා කෙරේ. කර්මය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම සමාජගත වීමේ ස්වරූපය සහ ඒ පිළිබඳ මිනිසුන්ගේ වටහා ගැනීම් සමාජ ප්‍රගතියට බලපාන්නේ කෙසේ ද යන්න අධ්‍යයනය කිරීම මෙහි පර්යේෂණ ගැටලුව වේ.

**පර්යේෂණ සාහිත්‍ය සමීක්ෂාව හා පර්යේෂණ ක්‍රමවේදය**

කර්ම සිද්ධාන්තයේ ඇතිවීම සහ වර්ධනය පිළිබඳ සමාජවිද්‍යාත්මක අධ්‍යක්ෂණයක් යනුවෙන් මහාචාර්ය ඉත්තදෙමලියේ ඉන්දසර හිමියන් ඥාණගවේසී 2009 කලාපයට ශාස්ත්‍රීය ලිපියක් සම්පාදනය කොට ඇත. එහි ප්‍රධාන වශයෙන් සාකච්ඡාවට ලක් වන්නේ කර්මයෙහි ඇති වීම සහ වර්ධනය පිළිබඳ ය. සමාජ බලපෑම හෝ සමාජගත ව ඇති කර්ම සිද්ධාන්තය පිළිබඳ කරුණු දක්වා සාකච්ඡා වී නැත. කර්මය වෙනස් කළ හැක්කේ කෙසේ ද? යනුවෙන් මැදගම පියරතන හිමි ශාස්ත්‍රීය ලිපි සරණිය, 2 කාණ්ඩය, 2014 කලාපයේ දැකිය හැකි අතර, එහි දී කරන ලද කර්මයන් කිසියම් වූ ආකාරයකින් වෙනස් කළ හැකි ද? යන කරුණු සාකච්ඡා කොට ඇත. කර්මය හා භවය, බුදුසමයාගත කර්ම සංකල්පයේ විශේෂතා, කර්මය විෂය වශයෙන් සඟරා කිහිපයක ම ශාස්ත්‍රීය ලිපි පෙළක් දක්නට ලැබේ. එහි දී ප්‍රධාන වශයෙන් බෞද්ධ කර්ම සිද්ධාන්තය පිළිබඳවත් එහි ඵල-විපාකයන් කෙසේ ඇති වන්නේ ද යන්න පිළිබඳ මූලික වශයෙන් සාකච්ඡා කොට ඇත. මීට  අමතර ව තවත් නොයෙකුත් කෘතින්හි මෙන් ම සඟරාවන්හි ද කර්මය පිළිබඳ විවිධ නයින් කරුණු සාකච්ඡා වන අතර, වැඩි කොටසක් මූලිකත්වය දී ඇත්තේ මූලික බෞද්ධ සිද්ධාන්තය තහවුරු කිරීමට මෙන් ම එහි විපාක දීම පිළිබඳ සාකච්ඡා කිරීමට ය. නමුත් මෙම පර්යේෂණය මූලික වන සමාජ බලපෑම පිළිබඳ ව හෝ සමාජගත ව ඇති කර්ම සිද්ධාන්තය පිළිබඳ හෝ කරුණු සාකච්ඡා කිරීමක් සිදු කර ඇති බවක් දක්නට නො ලැබේ.

**පර්යේෂණ සමාලෝචනය හා පර්යේෂණ නිගමනය**

කර්මය යන්න සපුරා ම බැහැර කළ හැක්කක් හෝ කර්මය සියල්ලෙහි පදනම බව පිළිගත හැක්කක් ද නො වේ. එසේ කර්මය බැහැර කළ අයවලුන් අකිරියවාදීන් ලෙසත් කර්මය පිළිගත් අයවලුන් කිරියවාදීන් ලෙසත් ජනප්‍රිය විය. බුදුසමය සපුරා ම එම අන්තවාදී දෘෂ්ටින් ප්‍රතික්ෂේප කරයි. බුදුහිමියන්ට පවා කර්ම විපාක දුන් අවස්ථාවන් බෞද්ධ සාහිත්‍යයෙන් අපට දැකගත හැකි ය. දේවදත්තයන් විසින් ගල් පෙරලූ අවස්ථාවේ ශ්‍රී පතුල තුවාල වන්නේ ද වේරංජාවේ වස් තුන්මාසය මුළුල්ලේ ම දානය නො ලැබී යන්නේ ද ලේ අතීසාරය යන රෝගය ද පැවතියේ පෙර කරන ලද කර්මයන්ගේ විපාක වශයෙන් ය. එසේ ම මහරහතන් වහන්සේලාට ද කර්ම විපාක දුන් අවස්ථා දැකිය හැකි ය. ඒ පිළිබඳ ජනප්‍රිය ම නිදසුන

වන්නේ මුගලන් හිමියන්ට මුහුණ දීමට සිදු වූ සිද්ධිය යි. එය පෙර කරන ලද කර්මයෙහි විපාක වශයෙන් සිදු වී ඇත. මෙලෙස පෙල සාහිත්‍යයාගත සිදුවීම් පිළිබඳ දැනීමක් ඇති අයෙකුට කර්මය විපාක නො දෙන්නේ කෙසේ දැ'යි ප්‍රතිප්‍රශ්න නගමින් තර්ක කළ හැකි ය. නමුත් මෙහි දී අප අවබෝධ කළ යුත්තේ කර්ම පඩිසන් නො දෙනවා ය යන්න නො ව අතීත හෝ වර්තමාන කර්ම විපාක දෙනු ලබන්නේ ඒ ඒ අවස්ථානුරූපී ව හේතුඵල සබඳතාව මත කම්මනියාම ධර්මතාව යටතේ බව ය. එයින් සියල්ල සිදු වන්නේ කර්මය නිසාවෙන් යන්න ද අදහස් නො වේ. නමුත් මෙම වැටහීම මහ සමාජයට නැත. ඔවුහු සියල්ල කර්මය මඟින් සිදු වේ ය යන අදහස දරන්නේ තම තමන්ගේ ගැලවීමට පාර සොයාගන්නා අටියෙන් ය. නමුත් මෙම තත්ත්වය දාර්ශනික වශයෙන් ගතහොත් ගැලවීමක් නො ව සාංසාරික වශයෙන් මංමුළා වීමක් බව ඔවුන්ට නො වැටහේ. මෙනිසා කර්මය පිළිබඳ සමාජගත මෙම මිථ්‍යා මතය ඛණ්ඩනය කිරීම කාලීන අවශ්‍යතාවක් වේ. කර්මය පිළිබඳ නියම බෞද්ධ මතය සමාජගතව නොමැත. සමාජගත ව ඇත්තේ අන්තවාදී කර්ම සඞ්කල්පයකි. එම කර්ම සඞ්කල්පය විසින් සමාජයේ ප්‍රගතියට සෘජු බලපෑමක් කෙරෙයි. යමෙක් මෙම සංවර්ධන පරිහාණිය සිදු වූයේ කර්මය පිළිබඳ බෞද්ධ මතය සමාජගත වීම නිසා බව කියන්නේ නම් ඔවුන් කර්මය විෂයෙහි අචින්ත්‍ය ස්වභාව නො දත් මිසදිටු පිරිසක් බව කෙටියෙන් නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද:** බුදුසමය, කර්මය, සමාජය, පුද්ගලයා, සංවර්ධනය

මූලාශ්‍රය


- **අඞ්ගුත්තරනිකාය II, III, IV.** (2005). බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **මජ්ඣිමනිකාය**, I, II, III. (2005). බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (2002). **ථෙරවාද බෞද්ධ දර්ශනය** - 1 කොටස. කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.
- ගමගේ, දීගොඩ එස්. (2004). **සමස්ත බුද්ධ ධර්මය.** කොළඹ: සමයවර්ධන පොත්හල.
- මහාචාර්ය කරුණාරත්න, ඩබ්ලිව්. ඇස්. (1996), **බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රීය ලේඛන සඞ්ග්‍රහය.** කොළඹ: සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ.
- මහාචාර්ය කරුණාරත්න, ඩබ්ලිව්. ඇස්. (1987). **බෞද්ධ දර්ශනය සහ චරණය.** දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.